## විශේෂ නිවේදනයයි

-

### විශේෂ ගුවන් යානය මගින් ශ්‍රී ලංකාව වෙත පිටත්වීම

ඊශ්‍රායලයේ වාසය කරන නැවත ශ්‍රී ලංකාව වෙත පිටත්ව යැමට මේ වන විටත් ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී සිටින සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙතයි,

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම තානාපති කාර්යාලය මගින් **2020.08.19, 2020.08.20 2020.08.21, 2020.08.23, 2020.08.24** හා **2020.08.25** දින වලින් නිකුත් කරන ලද නිවේදන වලට වැඩිමනත් වශයෙණි.

ඒ අනුව ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් රැගත් විශේෂ ගුවන් යානය **2020.08.30** දින ඊශ්‍රායලයෙන් පිටත්වීමට නියමිතව තිබූ නමුත් රජයේ නිරෝධායන මධ්‍යස්ථාන වල ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් එම ගුවන් ගමන අවලංගු කල බව මේ වන විටත් ඔබ දන්නා කරුණකි.

තවද, **2020.09.02** වන දිනට ඊශ්‍රායලය වෙත **විශේෂ ගුවන් යානාවක්** එවීමට ශ්‍රී ලංකා බලධාරීන් විසින් කටයුතු කර ඇති අතර අදාල විශේෂ ශ්‍රී ලංකන් ගුවන් යානය **2020.09.02** වන දින ඊශ්‍රායලයේ බෙන්ගුරියොන් **(Ben Gurion)** ගුවන් තොටුපලින් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල **(BIA)** දක්වා ගමන් කිරීමට නියමිතව ඇත.

ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සම්බන්ධ තොරතුරු ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් තානාපති කාර්යාලය වෙත දැනුම් දුන් පසු ඒ බව ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

### PCR පරීක්ෂණය සිදු කර ගැනීම සඳහා උපදෙස්

PCR පරීක්ෂණය සිදු කර ගැනීම සඳහා තානාපති කාර්යාලය විසින් **2020.08.20** දින සහ **2020.08.23** දින නිකුත් කරන ලද නිවේදනයන්හි සඳහන් පරිදි තමන් කැමති / තමන්ට පහසු ස්ථානයකින් **2020.08.30** දින **PCR** පරීක්ෂණය සිදු කර එම ප්‍රතිඵල **2020.08.31** දින සවස **6.00** ට පෙර තානාපති කාර්යාලය වෙත වට්ස් අප් **(WhatsApp)** අංක **058-6875764** මගින් ලබා දිය යුතු බව අවධාරණය කරනු ලැබේ.

### ඊශ්‍රායලයෙන් පිටවීමට පෙර ඊශ්‍රායලයේ සෞඛ්‍ය අමාත්‍යාශය වෙත ලබා දිය යුතු තොරතුරු පත්‍රිකාව

තානාපති කාර්යාලය විසින් **2020.08.21** දින නිකුත් කරන ලද නිවේදනයෙහි සඳහන් පරිදි මෙරටින් පිටවීමට පැය **24** ට පෙර ඊශ්‍රායල් සෞඛ්‍ය අමාත්‍යාංශයේ පහත සඳහන් පිටවීමේ මාර්ගගත ඉල්ලුම් පත්‍රය **(Online Departure Application)** යොමු කිරීමෙන් පසුව ලැබෙන අවසර පත්‍රයද රැගෙන ගුවන් තොටුපල වෙත පැමිණිය යුතු බව දන්වා සිටිනු ලැබේ.

**https://govforms.gov.il/mw/forms/ExitFromIsrael@health.gov.il**

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව් ඊශ්‍රායලය
**2020.08.26**